**ශීර්ෂය 171 - කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශය**

**--------------------------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශීර්ෂය 171 - කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශ වලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන් දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමණාකරණ විගණන වාර්තාව 2023 ජුනි 08 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම , විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 අග්‍රිම කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ රාජ්‍ය අංශයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම පිළිබඳ මාර්ගෝපදේශ අංක 12 හි (ඇ) ඡේදය පරිදි වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අක් මුදල් අවශ්‍යතා සැලැස්ම පිළියෙල කළ යුතු වුවත්, අමාත්‍යාංශය විසින් එම අක් මුදල් සැලැස්ම පිළියෙල කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේ සිට ක්‍රියාකාරී සැලැස්ම සමඟ අක් මුදල් අවශ්‍යතා සැලැස්මද විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව. | රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. |

### 2.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අවශ්‍යතා නිසි ලෙස හඳුනාගෙන එය ඇගයීමට ලක්කර ප්‍රතිපාදන වෙන් කරවා ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් 2022 වර්ෂයේ සුභසාධන ව්‍යාපෘති දෙකක් සඳහා වෙන් කරගත් වාර්ෂික ප්‍රතිපාදනයෙන් රු.12,935,933,873 ක් උපයෝජනය කර නොතිබුණි. | සුභසාධන ව්‍යාපෘති සඳහා ලබාදුන් ආධාර සඳහා මැයි, ජූනි සහ ජූලි මාසවලට අදාල දීමනා වියදම ලෝක බැංකුව ප්‍රතිපූර්ණය කල අතර නොවැම්බර් දීමනාව ADB ආධාර මත ගෙවීම නිසා ප්‍රතිපාදන ඉතිරි වූ බව. | වෙන්කරගත් ප්‍රතිපාදන උපරිම ලෙස උපයෝජනය කළ යුතු අතර අවශ්‍යතාවය නිසි පරිදි හඳුනාගෙන ප්‍රතිපාදන වෙන් කර ගත යුතුය. |
| (ආ) | පූර්ව ළමාවිය රැකවරණය සහ සංවර්ධනය සඳහා ලෝක බැංකුව යටතේ ලබාදුන් රු.මි.189.5 ක ප්‍රතිපාදනයෙන් රු.මි.144.4 ක ප්‍රතිපාදන ඉතිරිවී තිබූ අතර කොන්ත්‍රාත් 18 ක වැඩ නතරවී තිබුණි. | ගොඩනැගිලි ද්‍රව්‍ය මිල ගණන් විශාල ලෙස ඉහල යාම නිසා කොන්ත්‍රාත් 18 ක වැඩ නතර වීම ඉතිරියට හේතු වී ඇති බව. | වෙන්කරගත් ප්‍රතිපාදන උපරිම ලෙස උපයෝජනය කළ යුතුය. |
| (ඇ) | අමාත්‍යාංශය විසින් පුනරාවර්තන වැය විෂයයන් 7 කට අදාලව අවසන් කාර්තුවේදී මුදල් රෙගුලාසි 66 මාරු කිරීම් යටතේ සලසා ගෙන තිබුණු එකතුව රු.57,890,000 ක් වූ ප්‍රතිපාදනවලින් රු.41,657,227 ක් උපයෝජනය නොකිරීම හේතුවෙන් සියයට 20 සිට සියයට 100 දක්වා වූ පරාසයක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. | 2022 වර්ෂයේ අවසාන කාර්තුවේ රට තුල පැවති අයහපත් ආර්ථික කඩා වැටීම අනුව ඉන්ධන මිල ඉතා වේගයෙන් දිනෙන් දින ඉහල යාම අනුව මිල ගණන් අනුමාන කිරීම මත අවශ්‍ය හිඟ ප්‍රතිපාදන සඳහා මු.රෙ. 66 මගින් මාරු කරගන්නා ලදී. එමෙන්ම ITMIS පද්ධතිය තුලින් මු.රෙ 66 මාරු කිරීම් කලයුතු නිසාද වර්ෂය අවසාන දින තෙක් නොසිට මෙම මාරු කිරීම් සිදුකල නිසාද මිල ඉහල යාම අපේක්ෂා කිරීම මත මාරු කල ප්‍රතිපාදනයන්හි ඉතිරි වීමක් සිදුවී ඇති බව. | ඇස්තමේන්තු නිවැරදිව පිළියෙලකර ප්‍රතිපාදිත මුදල් උපරිම ලෙස උපයෝජනය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුල පරිපූරක ඇස්තමේන්තු මගින් අතිරේක ප්‍රතිපාදන ලෙස රු.912,076,000 ක් ලබා ගෙන ඉන් රු.145,835,161 ක් ප්‍රතිපාදන අදාල කාර්යය සඳහා යොදා ගැනිමකින් තොරව ඉතිරි වී තිබුණි. | සීමිත කාලය තුල මුදල් ප්‍රතිලාභින් වෙත ගෙවුවද විවිධ ගැටළු නිසා ඉතිරි වී ඇති බව. | අවශ්‍යතාවයකින් තොරව පරිපූරක ඇස්තමේන්තු මගින් ප්‍රතිපාදන වෙන් කරවා නොගත යුතුය. |
| (ඉ) | ළමා සංවර්ධනය සඳහා යොදා ගැනීම වෙනුවෙන් යුනිසෙෆ් සංවිධානයෙන් 2022 වර්ෂයේදී ලැබී තිබූ රු.12,076,000 ක මුදලින් රු.8,976,267 ක් අදාළ කාර්යය සඳහා යොදවා නොගෙන භාණ්ඩාගාරය වෙත යවා තිබුණි. | භාණ්ඩාගාර අක් මුදල් නොලැබීම මත අදාල වියදම් දරා නොතිබූ බව. | ලද අක් මුදල් අපේක්ෂිත කාර්යය ඉටුකර ගැනීමට යෙදවිය යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරික්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරික්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දිස්ත්‍රික් ළමා හා කාන්තා සංවර්ධන කමිටු රැස්වීම් ත්‍රෛමාසිකව පැවැත්වීම සිදුකළ යුතු වුවද 2022 වර්ෂය තුළදී පළමු කාර්තුවේ රැස්වීම් දිස්ත්‍රික්ක 15කද, දෙවන හා තුන්වන කාර්තුවල රැස්වීම් දිස්ත්‍රික්ක 19කද හතරවන කාර්තුවේ රැස්වීම් දිස්ත්‍රික්ක 21කද කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. මෙම කමිටු පැවැත්වීම සඳහා දිස්ත්‍රික්ක 25 වෙනුවෙන් වාර්ෂිකව රුපියල්930,800 ක ප්‍රතිපාදනයක් දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත නිදහස් කර තිබුණි. | ඉදිරියේදී දිස්ත්‍රික් කාර්යාල වලින් අදාල වාර්තා ලබාගැනීම මත රැස්වීම් පැවැත්වූ බව ප්‍රගතිය වාර්තා කිරීමට සටහන් කරගෙන ඇති බව. | නියමිත පරිදි කමිටු රැස්වීම් පැවැත්වීමට හා වාර්තා ලබාගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | 1938 දුරකථන සේවාව ක්‍රියාත්මක වීම සම්බන්ධව මෙහෙයුම් කමිටුවක් මගින් අධීක්ෂණය හා මෙහෙයවීම සිදුකරන බව කාර්යසාධන වාර්තාවෙහි දක්වා තිබුණද මෙහෙයුම් කමිටු අධීක්ෂණය හා මෙහෙයුම් අනු කමිටු රැස්වීම් 2020 ජුලි 30 දිනෙන් පසු පවත්වා නොතිබුණි. | රට තුළ ඇති වූ දේශපාලනික වෙනස්වීම හේතුවෙන් මෙහෙයුම් කමිටුව අහෝසි වීමත් සමඟ නැවත පත් කිරීමක් සිදු නොවූ බැවින් මෙහෙයුම් කමිටු අධීක්ෂණයන් සිදු නොවූ අතර මෙහෙයුම් අනු කමිටුවද ක්‍රියාත්මක නොවූ බව | මෙහෙයුම් කමිටු අධීක්ෂණය හා මෙහෙයුම් අනු කමිටු රැස්වීම් පැවැත්විය යුතුය. |

**3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව කාන්තා ව්‍යවසායකයන් වෙනුවෙන් ඩිජිටල් අලෙවිකරණ වේදිකාවක් (E- Pola) ස්ථාපිත කිරීම සඳහා 2022 වර්ෂය අවසාන වන විට රු.4,440,423 ක මුදලක් අමාත්‍යාංශය විසින් වියදම් කර තිබුණි. නමුත් මෙම පද්ධතිය තුල කාන්තාවන් 143 දෙනෙකු පමණක් ලියාපදිංචි කර තිබුණද අලෙවිකරණ කටයුතු 2022 වර්ෂය අවසන් වන විටත් ආරම්භ කර නොතිබුණි. ඒ අනුව මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ ඉටුකර ගැනීමට අපොහොසත් වී තිබුණි. | දැනට නියෝජ්‍ය අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ) තනතුර පුරප්පාඩුව පවතින බැවින් මෙම Lanka Women e-Market පද්ධතිය පිළිබඳ තාක්ෂණික උපදෙස් ලබාදීමට කිසිවෙක් නොමැති බව හා Lanka Women e-Market පද්ධතිය ක්‍රමවත් ලෙස පැවතියද ව්‍යවසායක කාන්තාවන්ගේ තොරතුරු තාක්ෂණ සාක්ෂරතාවය අවම වීම ඔවුන් ඩිජිටල් අලෙවිකරණ පද්ධතියක් භාවිතයට යොමුවීමට මැලිකමක් දක්වන බව. | ව්‍යාපෘති අරමුණු ඉටුකර ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. |

**3.3 විදේශ ආධාර ව්‍යාපෘති**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේඅදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ලෝක බැංකු ආධාර යටතේ අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක වන මුල් ළමාවිය සංවර්ධන ව්‍යාපෘතිය යටතේ කොන්ත්‍රාත් වටිනාකම රු.37,329,454 ක් වූ මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන 20 ක් ඉදිකිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ වාර්ෂික ඇස්තමේන්තු හා පරිපූරක ඇස්තමේන්තු මගින් රු.මිලියන 1,895 ක ප්‍රතිපාදන ලබා දී තිබුණද සැලැස්මට අනුව කටයුතු නොකිරීම හේතුවෙන් නියමිත කාලසීමාව තුල අදාල ව්‍යාපෘති නිම කර නොතිබුණි. | 2022 වර්ෂය තුළ ඉදිකිරීමට ගිවිසුම්ගතව තිබූ මෙම මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන ඉදිකිරීම අවලංගු කිරීමට සිදු වූයේ 2022 වර්ෂය තුළ ගොඩනැගිලි ද්‍රව්‍ය වල මිළ ගණන් සීඝ්‍රයෙන් විශාල පරාසයකින් ඉහළ යාම, අමුද්‍රව්‍ය හිඟය සහ ඉන්ධන හිඟය නිසා මතු වූ ප්‍රවාහන අපහසුතා හේතුවෙන් කොන්ත්‍රාත්කරුවන් විසින් අනපේක්ෂිත ලෙස වැඩ නතර කරන ලද බැවිනි. එම ගැටළු මතු නොවූයේ නම් සැලසුම්කල පරිදි නියමිත කාලසීමාව තුල එම ඉදිකිරීම් අවසන් කිරීමට හැකියාව තිබූ බව. | සැලැස්මට අනුව ඉදිකිරීම් කළ යුතුය. |

### 3.4 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේඅදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශයට අයත් රු.35,000,000 ක් වටිනා බෙන්ස් රථය අමාත්‍යාංශය තුල රඳවා තබා ගෙන තිබූ අතර මෙම රථය 2022 ජුලි 12 දින සිට විගණන අවස්ථාව වන 2023 මාර්තු 15 දින වන විට මාස 08 ක කාලයක් ධාවනයේ නොයෙදවා නිශ්කාර්යව පැවතුණි. | මෙම මෝටර් රථය ගරු අමාත්‍යවරයා සඳහා වෙන් කළ වාහනයක් බවත්. මෙම අමාත්‍යාංශයේ කැබිනට් අමාත්‍යවරයා අතිගරු ජනාධිපතිතුමන් වන බැවින් මෙම වාහනය අමාත්‍යවරයා වෙත ලබාදීමේ අවශ්‍යතාවයක් ඇතිනොවූ බව. මෙම මෝටර් රථය ලේකම්ගේ නිල රථය ලෙස තාවකාලිකව අනුයුක්ත කර ඇති බව. | වත්කම් උපරිම කාර්යක්ෂමතාවය කින් උපයෝජනය කළ යුතුය. |
| (ආ) | ග්‍රාම ශක්ති කාර්යාංශය, සෞභාග්‍යා කාර්යාංශය වශයෙන් සංශෝධනයේදී ග්‍රාම ශක්ති කාර්යාංශය සතුව පැවති අයිතම් 21 කට අදාල භාණ්ඩ ඒකක 60 ක් සෞභාග්‍යා කාර්යාංශය වෙත පවරාගැනිමට කටයුතු කර නොතිබුණි. | ග්‍රාම ශක්ති කාර්යාංශයට අයත් අදාල භාණ්ඩ වතු නිවාස හා ප්‍රජා යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශයට පවරාගන්නා ලද අතර අදාළ ලිපියෙහි ඇතැම් අයිතම මෙම අමාත්‍යාංශයට ලැබී නොමැති බව. | වත්කම් නිවැරදිව පවරාගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.5 රජයේ නිලධාරීන් ඇප තැබීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අමාත්‍යාංශයේ ඇප තැබිය යුතු නිලධාරීන් 13 දෙනෙකුගෙන් ඇප තැන්පතු ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ වන විට නිලධාරීන් 04 දෙනෙකුගේ ඉල්ලුම් පත්‍ර අන්‍යොන්‍ය ඇපකාර සංගමය වෙත ඉදිරිපත්කර ඇති අතර, ඇප මුදල් බැදීම සඳහා නිලධාරීන් වෙත ලිපි යවා ඇති බව. | ඇප තැන්පතු ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.6 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2014 සැප්තැම්බර් 24 දින අනතුරට පත්වූ වාහනය වර්ෂ 8 ට වැඩි කාලයක් ගතවී තිබුණද අළුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණි. අනතුර සම්බන්ධයෙන් මුදල් රෙගුගාසි 104(3) ප්‍රකාරව ප්‍රාරම්භක වාර්තාව අනතුර සිදුවී වර්ෂ 2 කට පසුව ඉදිරිපත් කර තිබූ අතර රක්ෂණ වන්දි වසර 6 කට පසු එනම් 2020 ඔක්තෝබර් 26 දින ඉල්ලුම්කර තිබුණි. | හදිසි අනතුර සම්බන්ධව රක්ෂණ වන්දි ලබා ගැනීමට අදාළ තොරතුරු රක්ෂණ සමාගම වෙත ලබාදී ඇත. 2023.04.10 දින රක්ෂණ වන්දි ලබාගැනීම සඳහා නැවත වරක් අදාළ තොරතුරු සමඟ අභියාචනයක් රක්ෂණ සමාගම වෙත යොමු කර ඇති බව. | වාහන අනතුරු සම්බන්ධව ප්‍රමාදයකින් තොරව අදාල කටයුතු සිදුකර රක්ෂණ වන්දි නිසි පරිදි ලබාගැනීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2015 ජුනි 8 දින ජල පහරකට අසුවීමෙන් අනතුරට පත් වී තිබූ Land Cruiser Jeep රථයේ අලුත්වැඩියාව සඳහා රු.6,817,698 ක මුදලක් වැය වී තිබූ අතර ඉන් රක්ෂණ සමාගම විසින් නොගෙවන ලද රු.3,450,945 ක මුදල මුදල් රෙගුලාසි 104(4) වාර්තාව අනුව රියදුරු මහතාගෙන් අයකර ගන්නා ලෙස දක්වා තිබුණි. එහෙත් එම මුදල අමාත්‍යාංශය විසින් 2021 දෙසැම්බර් මාසයේදී ගෙවීම හේතුවෙන් රජයට රු.3,450,945 ක මූල්‍ය අලාභයක් සිදු වී තිබුණි. | 2019 වර්ෂය වනවිට රථයේ අළුත්වැඩියා කටයුතු අවසන් කරන ලද නමුත් හිඟ මුදල වන රු.3,450,950/-ක් නොගෙවීම හේතුවෙන් රථය දීර්ඝ කාල සීමාවක් ගරාජයේ ගාල්කර තැබීමට සිදුවිණි. ඒ අනුව ඉදිරි කටයුතු සම්බන්ධව නීතිපති විසින් ලබාදී ඇති උපදෙස් පරිදි රක්ෂණ සංස්ථාව වෙත නැවත ලිපියක් ඉදිරිපත් කරන ලදී. ඒ පිළිබඳ ඉදිරි කටයුතු සිදුකරමින් පවතින බව. | වාහන අනතුරු සම්බන්ධව ප්‍රමාදයකින් තොරව කටයුතු කර රක්ෂණ වන්දි නිසි පරිදි ලබාගැනීමට කටයුතු කල යුතුය. |
| (ඇ) | 2022 මැයි 09 දින භාවිතයට ගත නොහැකි ලෙස ගිනිතැබීමට ලක් වූ මෝටර් රථයට සිදු වූ හානිය තක්සේරු කර සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයේ පාඩු හා අත්හැරීම් ප්‍රකාශයේ ඇතුලත්කර නොතිබුණි. මුදල් රෙගුලාසි 104(4) යටතේ වූ අවසන් වාර්තාව අනුව රක්ෂණ සමාගමෙන් රු.16,500,000 ක් අයකර ගත හැකි බව දක්වා තිබුණද 2023 මැයි 31 දක්වාම අය කර ගැනීමට අපොහොසත් වී තිබුණි. | එම හානිපූරණය සිදුකිරීමට අදාළව රු.16,500,000/-ක අගය ගෙවීම් කර 2023.05.09 දින අංක 845063 දරණ චෙක්පත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් ඉදිරිපත් කරන ලදී. චෙක්පත් නාමය සංශෝධනය සඳහා නැවත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙත ඉදිරිපත් කලද නාමය සංශෝධිත චෙක්පත මෙතෙක් ලැබී නොමැති බව. | වාහන අනතුරු සම්බන්ධව ප්‍රමාදයකින් තොරව කටයුතු කර රක්ෂණ වන්දි නිසි පරිදි ලබාගැනීමට කටයුතු කල යුතුය. |
| (ඈ) | 2015 මාර්තු 10 දින අනතුරට පත්වූ ජීප් රථය හේතුවෙන් යථා තත්ත්වයට පත් කිරීම සඳහා රු.8,505,997 ක අළුත්වැඩියා ඇස්තමේන්තුවක් ලබා දී තිබූ අතර රක්ෂණ සමාගම ජීප් රථයේ අයිතිය පවරාගෙන රු.මිලියන 4.5 ක් ලබා දීමට එකඟ වී තිබුණි. 2022 මාර්තු 9 දින රක්ෂණ සමාගමේ ලිපිය අනුව රක්ෂණ සමාගම වෙත වාහනය පවරා ගැනීමට ප්‍රමාද ගාස්තු ලෙස සියයට 5 ක දඩ මුදලක් අය කරන බව දක්වා තිබුණද, එකඟ වූ මුදලින් සියයට 7 ක දඩයක් අයකර රු.4,193,050 ක මුදලක් පමණක් අමාත්‍යාංශයට ගෙවීම් කර තිබුණි. මෙහිදී සිදුවූ හානිය/පාඩුව මුදල් රෙගුලාසි 105(ඈ) අනුව තක්සේරු කර නොතිබූ අතර වාහනය යථාතත්ත්වයට පත් කිරීමට වැයවන මුදලට සමාන වටිනාකමක් රක්ෂණ වන්දි ලෙස ලබා ගැනීමට කටයුතු නොකිරීම විගණනයේදී ගැටළු සහගත විය. | රථයේ අළුත්වැඩියා ගාස්තුව ඉහළ අගයක් වන බැවින් රක්ෂණ සමාගම විසින් ඉදිරිපත් කරන ලද හානිපූරණ අවස්ථා 2 අතුරින් අබලි රථය රක්ෂණ සමාගම වෙත පවරා රු.4,500,000/-ක මුදල අමාත්‍යාංශය වෙත ලබා ගැනීමට රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලයේ නිර්දේශ ලබා දෙන ලදී. | වාහන අනතුරු සම්බන්ධව ප්‍රමාදයකින් තොරව කටයුතු කර නිසි පරිදි රක්ෂණ වන්දි ලබා ගැනීමට ක්‍රියා කල යුතු අතර ප්‍රමාදයට වගකිව යුතු අය හඳුනාගෙන ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.7 කළමනාකරණ දූර්වලතා

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ළමා අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පිළිබඳ එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් කමිටුව වෙත නිවැරදි , කාලීන දත්ත හා වාර්තා අදාල ආයතනයට සැපයීමේ අරමුණෙන් UNCRC (United Nation Convention on the Rights Of the Child) දත්ත පද්ධතිය නිර්මාණය කර තිබුණි. දත්ත පද්ධතිය සකස් කිරීමට සහ එහි උපදේශන කටයුතු වෙනුවෙන් රු.2,350,000 ක් වැය කර දත්ත පද්ධතිය සංවර්ධනය කර පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව වෙත ලබා දී තිබුණද, 2023 අප්‍රේල් 18 දින වන විටත් මෙම දත්ත පද්ධතිය ප්‍රයෝජනයට නොගෙන නිශ්කාර්යව පැවති අතර අපේක්ෂිත අරමුණද ඉටුවී නොතිබුණි. | මෙම දත්ත පද්ධතිය දත්ත ඇතුලත් කිරීම සහ එම දත්ත බලාත්මක කිරීම සම්බන්ධයෙන් අදාල අමාත්‍යාංශවල දත්ත අනුමත කරන නිලධාරින් පුහුණු වැඩසටහන් මගින් දැනුවත් කර ඇත. කෙසේ වුවද මෙම දත්ත පද්ධතිය මෙතෙක් අවශ්‍ය පරිදි ප්‍රයෝජනයට ගැනීමට නොහැකිවී ඇති බව. | අවශ්‍යතාව හඳුනා ගෙන දත්ත පද්ධතිය භාවිතයට ගත හැකි ලෙස සැකසිය යුතුය. |